ශ්‍රී ලංකා තේ මණ්ඩලය - 2024

--

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් ප්‍රකාශනය, වෙනත් විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරු ඇතුළත් මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන් වලින් සමන්විත 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ ,1975 අංක 14 දරන ශ්‍රී ලංකා තේ මණ්ඩල පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, මණ්ඩලය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය මණ්ඩලය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා මණ්ඩලයේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

මණ්ඩලයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, මණ්ඩලයේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් , චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.
- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ,ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.
- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් මණ්ඩලයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කල මණ්ඩලයේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි

විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ මණ්ඩලයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, මණ්ඩලය ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

1.5.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

	අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	මණ්ඩලය විසින් සමාලෝචිත වර්ෂය අවසානය වන විට සම්පූර්ණයෙන් ක්ෂය කරනු ලැබූ පිරිවැය රු. 167,519,802 ක් වූ වත්කම් තවදුරටත් ප්‍රයෝජනයට ගනිමින් පැවතියද, ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 16 හි 51 ඡේදය ප්‍රකාරව එම වත්කම්වල ඵලදායි ජීව කාලය නැවත තක්සේරු කර ගිණුම් ගත කිරීම හෝ ගිණුම් වල හෙළිදරව් කිරීම සිදුකර නොතිබුණි.	මණ්ඩලයේ වත්කම්වල ඵලදායි ජීව කාලය නැවත තක්සේරු කිරීම 2025 වර්ෂය තුළදී අවසන් කිරීමට සහ 2025 වර්ෂයේ අවසන් ගිණුම්වල ගිණුම්කරණ ප්‍රමිති16හි 51 ඡේදය ප්‍රකාරව ගිණුම් ගත කිරීමට සහ අවසන් ගිණුම් වල හෙළිදරව් කිරීම් සිදු කිරීමට පියවර ගනු ලැබේ.	සම්පූර්ණයෙන්ම ක්ෂය කර අවසන් වුවද භාවිතා කරනු ලබන වත්කම් සම්බන්ධයෙන් හෙළිදරව් කිරීම කළ යුතුය.
(ආ)	ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති අංක 19 ප්‍රකාරව විශ්‍රාම ප්‍රතිලාභ වගකීම ගිණුම්ගත කිරීමේදී වට්ටම් අනුපාතය ලෙස සියයට 11.47 ක් වූ දිගුකාලීන භාණ්ඩාගාර බැදුම්කර පොලී අනුපාතය භාවිතා කළ යුතු වුවද මණ්ඩලය විසින් සියයට 8.96 ක් වූ කෙටිකාලීන භාණ්ඩාගාර බිල්පත් පොලී අනුපාතය භාවිතා කර තිබුණු බැවින් මූල්‍ය වර්ෂය අවසානයේදී විශ්‍රාම ප්‍රතිලාභ පිරිවැය රු.384,779 ක් අවප්‍රමාණය වී, නිර්ණිත සේවක ප්‍රතිලාභ වගකීමේ වර්තමාන වටිනාකම සහ විශ්‍රාම ප්‍රතිලාභ මත සත්‍ය අලාභය පිළිවෙලින් රු.9,130,758 ක් සහ රු.9,515,537 ක් අධිගණනය වී තිබුණි.	2024 වර්ෂයේ වැරදි නිවැරදි කිරීම් වලට අදාල හෙළිදරව් කිරීම් 2025 වර්ෂයේ ගිණුම් වල සිදුකරනු ඇත..	ගිණුම්කරණ ප්‍රමිතිය ප්‍රකාරව විශ්‍රාම ප්‍රතිලාභ වගකීම ගිණුම්ගත කිරීමේදී වට්ටම් අනුපාතය ලෙස දිගුකාලීන භාණ්ඩාගාර බැදුම්කර පොලී අනුපාතය භාවිතා කළ යුතුය.

1.5.2 ගිණුම්කරණ අඩුපාඩු

	විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	"සිලෝන් ටී" සඳහා ගෝලීය ප්‍රවර්ධන සහ අලෙවි වැඩසටහනෙහි නිර්මාණාත්මක කාර්යයන් 06 ක් සිදුනොකිරීමට මණ්ඩලය විසින් 2022 වර්ෂයේදී තීරණය කර තිබුණද, ඒ සඳහා 2017 වර්ෂයේදී අරමුදලින් වෙන්කරන ලද රු.9,414,411 ක වියදම නැවත ගැලපීමට කටයුතු නොකිරීම නිසා සමාලෝචිත වර්ෂයේදී ජංගම වගකීම් අධිගණනය වී ප්‍රවර්ධන හා අලෙවි තැන්පතු අවප්‍රමාණය වී තිබුණි.	ජ'නල් සටහන් මගින් 2025 වර්ෂයේදී නිවැරදි කරන ලදී.	මූල්‍ය වර්ෂය අවසානයේදී උපචිත වියදම් සමාලෝචනය කර අවශ්‍යය ගැලපීම් කළ යුතුය.
(ආ)	පසුගිය වර්ෂයට අදාලව 2024 පෙබරවාරි 07 දින ප්‍රධාන ගබඩාව වෙත සැපයුම්කරන ලද රු. 952,695 ක කාර්ය මණ්ඩල තේ තොග (Staff Tea) පෙර වර්ෂයට අදාළ වියදමක් ලෙස හඳුනාගැනීම සිදුකර නොතිබුණු බැවින් සමාලෝචිත වර්ෂය අවසානයට එම ප්‍රමාණයෙන් මාර්ගස්ථ තොග වටිනාකම සහ රඳවාගත් ඉපයුම් අධිගණනය වී තිබුණි.	2025 වර්ෂය තුළදී නිවැරදි කර ඉදිරිපත් කරමි.	මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී ගිණුම් කාල පරිච්ඡේදයට අදාළ වියදම් නිවැරදිව හඳුනා ගෙන ගිණුම් තැබිය යුතුය.
(ඇ)	මණ්ඩලයෙහි නිම් තේ ඇසුරුම්කරු (SLTB Official Packer) වෙත පසුගිය මූල්‍ය වර්ෂයෙහි ලද තොග වෙනුවෙන් ගෙවන ලද රු. 6,396,185 ක් සමාලෝචිත වර්ෂයේ විකුණුම් පිරිවැයෙන් අඩුකිරීම නිසා එම ප්‍රමාණයෙන් විකුණුම් පිරිවැය අවප්‍රමාණය වී තිබුණි.	2025 වර්ෂය තුළදී නිවැරදි කර ඉදිරිපත් කරමි.	මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී ගිණුම් කාල පරිච්ඡේදයට අදාළ වියදම් නිවැරදිව හඳුනා ගෙන ගිණුම් තැබිය යුතුය.
(ඈ)	සමාලෝචිත වර්ෂය අවසානයට මූල්‍ය ප්‍රකාශන අනුව මණ්ඩලයේ ලැබිය යුතු ස්ථාවර තැන්පතු පොළී ශේෂය රු.38,741,610 ක් වුවද ලෙජරය අනුව එම ශේෂය රු.50,022,298 ක් වූයෙන් රු.11,280,688 ක වෙනසක් නිරීක්ෂණය විය.	2025 වර්ෂය තුළදී නිවැරදි කර ඉදිරිපත් කරමි.	ලැබිය යුතු ආදායම් නිවැරදිව හඳුනා ගෙන ගිණුම් තැබිය යුතුය.
(ඉ)	සමාලෝචිත වර්ෂය අවසානයට මූල්‍ය ප්‍රකාශන අනුව මණ්ඩලයට අයත් ස්ථාවර තැන්පතු මත ලද පොළිය	ගිණුම් ගත කිරීමේ දී සිදු වී ඇති ඌනතාවය 2025 වර්ෂයේදී නිවැරදි කර ඇත.	මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී පොළී ආදායම් වෙනුවෙන් රඳවා ගත් බදු,

	වෙනුවෙන් රඳවාගැනීම් බදු අඩු කිරීම් වටිනාකම රු.3,077,643 ක් වුවද ස්වතක්සේරු මත බදු ගණනය කිරීමේ උපලේඛන අනුව එම වටිනාකම රු.4,251,665 ක් වූයෙන් රු.1,174,022 ක වෙනසක් නිරීක්ෂණය විය.		නිවැරදිව ගිණුම් තුළ ගැලපීමට කටයුතු කළ යුතුය.
(ඊ)	මණ්ඩලය විසින් රඳවාගැනීම් බදු අඩු කරනු නොලැබූ රු.126,997,434 ක භාණ්ඩාගාර බිල්පත් වෙනුවෙන් ලද පොළී වටිනාකම සඳහා රඳවාගැනීම් බදු ලෙස රු.4,678,853 ක් ගිණුම්ගත කිරීම නිසා එම ප්‍රමාණයෙන් පොලී ආදායම අධිගණනය වී ආදායම් බදු වියදම අවප්‍රමාණය වී තිබුණි.	2025 වර්ෂයේ දී නිවැරදි කර ඇති අතර බදු ඌනතාවය 2025 වසරේ දී ගෙවීමට හා 2024/25 වර්ෂයේ දේශීය ආදායම් බදු දෙපාර්තමේන්තුව වෙතට ඉදිරිපත් කිරීමට කටයුතු කරනු ලැබේ.	රඳවා ගැනීමේ බදු නිවැරදිව හඳුනා ගෙන ගිණුම් තුළ අවශ්‍යය ගැළපීම් සිදු කළ යුතුය.
(උ)	ඉරානය සහ ශ්‍රී ලංකාව අතර ක්‍රියාත්මක තේ සහ තෙල් ගිවිසුම යටතේ ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව වෙතින් ලද අරමුදල් ස්ථාවර තැන්පතු තුළ ආයෝජනය කිරීමෙන් පසුගිය වර්ෂයේ ලද පොළියෙන් අඩුකර ප්‍රවර්ධන හා අලෙවි තැන්පතු ගිණුමට බැර කළ යුතු රු.9,628,606 ක මුදල මණ්ඩලයේ වියදමක් ලෙස උපචිත කර තිබුණි. සමාලෝචිත වර්ෂයේදී එම සටහන නිවැරදි නොවීම නිසා රු. 9,628,606 කින් උපචිත වියදම් අධිගණනය වී ප්‍රවර්ධන හා අලෙවි තැන්පතු හා රඳවාගත් ඉපයුම් එම ප්‍රමාණයෙන් අව ප්‍රමාණය වී තිබුණි.	ගිණුම්කරණ ගැලපිලි ජර්නල් සටහන් මගින් නිවැරදි කර ඉදිරිපත් කරමි.	මූල්‍ය වර්ෂය අවසානයේදී උපචිත වියදම් සමාලෝචනය කර අවශ්‍යය ගැලපීම් කළ යුතුය.
(ඌ)	පසුගිය වර්ෂයට අදාලව උපචිත කරන ලද රු.7,360,900 ක මුදල සමාලෝචිත වර්ෂයේ ගෙවීමේදී උපචිත වියදම් ගිණුමට හර කිරීම වෙනුවට ප්‍රවර්ධන හා අලෙවිකරණ බදු ආයෝජන පොලී ආදායම් ගිණුමට හර කිරීම නිසා රු. 7,360,903 කින් ප්‍රවර්ධන හා අලෙවිකරණ ආයෝජන පොලී ආදායම අවප්‍රමාණය වී උපචිත වියදම් අධිගණනය වී තිබුණි.	අදාල ගිණුම්කරණ ගැලපිලි ජර්නල් සටහන් මගින් නිවැරදි කර ඉදිරිපත් කරමි.	උපචිත ගෙවීම් නිරවුල් කිරීමේදී නිවැරදි ගිණුම් තුළින් ගැලපීමට කටයුතු කළ යුතුය.
(එ)	ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව වෙතින් ලද අරමුදල් සඳහා සමාලෝචිත වර්ෂයේ ලද රු.3,186,800 ක පොළී ආදායම් මණ්ඩලයේ අරමුදල් වෙනුවෙන් ලද පොළී ආදායමක් ලෙස	අදාල ගිණුම්කරණ ගැලපිලි ජර්නල් සටහන් මගින් නිවැරදි කර ඉදිරිපත් කරමි.	මණ්ඩලයේ ක්‍රියාකාරකම් තුළින් ජනිත වූ ආදායම නිවැරදිව හඳුනාගෙන ගිණුම් තුළ ගැළපීමට කටයුතු කළ යුතුය.

	මූල්‍ය ප්‍රකාශන තුළ හඳුනාගැනීම නිසා එම අගයෙන් වර්ෂයේ අතිරික්තය අධිගණනය වී ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව වෙත ගෙවිය යුතු වටිනාකම අව ප්‍රමාණය වී තිබුණි.		
(ඒ)	මණ්ඩලයට අයත් ස්ථාවර තැන්පතු වෙනුවෙන් ලද රු.13,901,940 ක පොලී ආදායම් ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව වෙතින් ලද අරමුදල් වෙනුවෙන් ලද පොලී ආදායමක් ලෙස මූල්‍ය ප්‍රකාශන තුළ හඳුනාගැනීම නිසා එම අගයෙන් සමාලෝචිත වර්ෂයේ මණ්ඩලයේ අතිරික්තය අව ප්‍රමාණය වී ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව වෙත ගෙවිය යුතු වටිනාකම අධිගණනය වී තිබුණි.	අදාල ගිණුම්කරණ ගැලපිලි ජර්නල් සටහන් මගින් නිවැරදි කර ඉදිරිපත් කරමි.	මණ්ඩලයේ ක්‍රියාකාරකම් තුළින් ජනිත වූ ආදායම නිවැරදිව හඳුනාගෙන ගිණුම් තුළ ගැළපීමට කටයුතු කළ යුතුය.
(ඔ)	කිසිදු ගණුදෙනුවක් සිදු නොවී ජ'නල් සටහන් මඟින් රු.20,178,561 ක මුදලක් ණය ගැතියන් හර කර ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව වෙත ගෙවිය යුතු පොලී ගිණුමට බැර කිරීම නිසා එම ගිණුම් එම ප්‍රමාණයෙන් අධිගණනය වී තිබුණි.	අදාල ගිණුම්කරණ ගැලපිලි ජර්නල් සටහන් මගින් නිවැරදි කර ඉදිරිපත් කරමි.	සත්‍ය වශයෙන් සිදු වූ ගනුදෙනු වලට අදාළ ගැලපීම් මූල්‍ය ප්‍රකාශන තුළ ඉදිරිපත් කිරීමට කටයුතු කළ යුතුය.
(ඕ)	ඉරානය සහ ශ්‍රී ලංකාව අතර ක්‍රියාත්මක තේ සහ තෙල් ගිවිසුමෙහි අරමුදල් පරිපාලනය වෙනුවෙන් මණ්ඩලය විසින් අයකරගත යුතු රු.1,800,000 ක පරිපාලන ආදායම් සහ රු.40,000 ක බැංකු ගාස්තු ආදායමක් ලෙස හඳුනාගෙන නොමැති බැවින් රු.1,840,000 කින් මණ්ඩලයේ අතිරික්තය අවප්‍රමාණය වී ඛනිජ තෙල් නීතිගත සංස්ථාව වෙත ගෙවිය යුතු වටිනාකම අධිගණනය වී තිබුණි.	2025 වර්ෂයේ දී පසුගිය වර්ෂයේ ලාභයට ගැලපුම් සිදුකිරීම මඟින් නිවැරදි කර ඇත.	මණ්ඩලයේ ක්‍රියාකාරකම් තුළින් ජනිත වූ ආදායම නිවැරදිව හඳුනාගෙන ගිණුම් තුළ ගැළපීමට කටයුතු කළ යුතුය.
(ක)	ගනුදෙනුකරුවන් විසින් මණ්ඩලයේ බැංකු ගිණුම් වෙතට සෘජුවම තැන්පත් කරන ලද රු.27,305,276 ක මුදල් වෙනුවෙන් ආදායම් මූලාශ්‍රය හඳුනාගෙන ගිණුම්ගත නොකිරීම නිසා මූල්‍ය ප්‍රකාශනය තුළට ඇතුළත් වී නොතිබුණි.	2025/01/31දින වන විට සෘජු තැන්පතුවලින් රු 9,634,259 ප්‍රමාණයක් වෙනුවෙන් ආදායම් මූලාශ්‍ර හඳුනාගෙන ඇත. ඉතිරි තැන්පතු වෙනුවෙන් හඳුනාගැනීමට අදාල කටයුතු කරමින් පවතී.	මූල්‍ය වර්ෂයට අදාළ සියළු ආදායම්, ගිණුම් තුළ හෙළිදරව් කිරීමට කටයුතු කළ යුතුය.

1.5.3 නොසැසඳු පාලන ගිණුම් හෝ වාර්තා

විෂයය	මූල්‍ය ප්‍රකාශන අනුව වටිනාකම රු.	අනුරූපී වාර්තා අනුව වටිනාකම රු.	වෙනස රු.	කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
රසායනාගර ආදායම	52,431,050	55,591,150	3,160,100	රසායනාගාර ආදායමෙහි පරස්පරතාවයන් අවම කිරීමටත්, එම පරස්පරතාවයන් සඳහා හේතූන් පද්ධති තුළින් ලබා ගැනීමටත්, රසායනාගාර ආදායම් හඳුනාගැනීමත් සඳහා වන අභ්‍යන්තර පාලන ක්‍රමවේදයන් ශක්තිමත් කිරීමට බලාපොරොත්තු වේ.	මණ්ඩලයේ රසායනාගාර පරීක්ෂණ සම්බන්ධ අභ්‍යන්තර පාලනය ශක්තිමත් කර එම ආදායම නිවැරදිව ගිණුම්ගත කළ යුතුය.

1.6 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්

1.6.1 ගෙවිය යුතු මුදල්

විගණන නිරීක්ෂණය	කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
තේ දළු සඳහා නියමිත මිල නොගෙවීම නිසා කරන ලද පැමිණිලි වෙනුවෙන් ගෙවීමට තේ කම්හල්හිමියන් විසින් මණ්ඩලයේ රු.92,049,849 ක් තැන්පත් කර ඇති නමුත් සමාලෝචිත වර්ෂය අවසානය තෙක් දළු හිමියන් වෙත ගෙවීමට කටයුතු කර නොතිබුණි.	සැපයුම්කරුවන් සම්බන්ධ නිවැරදි විස්තර ලබා ගැනීමට කටයුතු කර ඇති අතර ඒ අනුව අදාල සැපයුම්කරුවන් එම කම්හල් වෙත කැඳවා අපගේ නිලධාරීන් ඉදිරියේ අදාල ගෙවීම් සිදු කිරීමටත් සැපයුම්කරුවන් හෝ ඉල්ලුම්කරුවන් හඳුනාගත නොහැකි මුදල් ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ ගිණුමේ තවදුරටත් තබා ගැනීම සහ අදාල කම්හල්වලින් සිදු කරන ඉල්ලීම් අනුව නිදහස් කිරීමට කටයුතු කරනු ඇත.	ගෙවිය යුතු පාර්ශවයන් නිවැරදිව හඳුනාගෙන ඔවුන්ට හිමි මුදල් කඩිනමින් නිරවුල් කළ යුතුය.

1.6.2 අත්තිකාරම්

විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
මණ්ඩලය විසින් තේ පැළ මිලියන 25 ක විශේෂ ව්‍යාපෘතිය සඳහා කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය වෙත 2021 ජූලි 14 දින ලබා දෙන ලද රු.125,000,000 ක අත්තිකාරම් මුදලින් නොපියවූ මුදල රු.26,369,363 ක් විය. අධිකාරිය සමඟ එළඹි අවබෝධතා ගිවිසුමෙහි කාලයද 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වී තිබුණද අත්තිකාරම් මුදල නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.	මෙම ව්‍යාපෘතියට අදාලව සම්පූර්ණ සහතික කරන ලද වියදම් වාර්තාව කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය විසින් යොමු කර ඇති අතර ඒ අනුව ඊට අදාල ගිණුම්කරණ ගැළපීම් ගෙවීම්වලට අදාල වවුචර්පත් කුඩා තේ වතු සංවර්ධන අධිකාරිය විසින් ශ්‍රී ලංකා තේ මණ්ඩලය වෙත ඉදිරිපත් කිරීමෙන් අනතුරුව කඩිනමින් සිදු කිරීමට කටයුතු කරන බව දන්වා සිටිමි.	ගිවිසුම් ප්‍රකාරව ව්‍යාපෘතිය සඳහා උපයෝජනය කර නොමැති වටිනාකමක් පවතී නම් නැවත අයකර ගැනීමට හා අදාළ අත්තිකාරම් පියවා ගැනීමට මණ්ඩලය විසින් කඩිනමින් පියවරගත යුතුය.

1.7 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

	නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව	අනුකූල නොවීම	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	2021 නොවැම්බර් 16 දිනැති අංක 01/2021 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 3 ඡේදය	මණ්ඩලයේ මානව සම්පත් කළමනාකරණය ඇතුළු මෙහෙයුම් ක්‍රියාවලිය හා පාලනයන් පිළිබඳව මෙහෙයුම් අත්පොත සකස්කළ යුතු වුවද, මණ්ඩලය විසින් මෙහෙයුම් අත්පොත සකස්කර නොතිබුණි.	සම්පත්දායකයෙකු පත්කර ගැනීමට අවශ්‍ය ප්‍රසම්පාදන කටයුතු සිදු කිරීමට ආරම්භ කර ඇත. 2025 වර්ෂය තුලදී මෙම අත්පොත කෙටුම්පත් කිරීමට අපේක්ෂා කරනු ලැබේ.	මෙහෙයුම් අත්පොත සකස්කර එහි කාර්‍යයන් විධිමත් අනුමැතියක් යටතේ ක්‍රියාත්මක කළ යුතුය
(ආ)	2023 අගෝස්තු 05 දිනැති අංක 2343/63 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය හා අමප/24/0152/612/014 හා 2024 පෙබරවාරි 13 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය	අලෙවි ප්‍රවර්ධන අරමුදලට මාරු කරනු ලබන බලපත්‍ර ගාස්තු වටිනාකම තේ අලෙවි ප්‍රවර්ධන කටයුතු සඳහා යොදාගත යුතු වුවද ඊට පටහැනිව මණ්ඩලය විසින් තේ ප්‍රවර්ධන අරමුදලින් ජනාධිපති කාර්යාල සුභසාධක සංගමය වෙත රු.1,000,000 ක් සහ, ජාතික වැවිලි කළමනාකරණ ආයතනයේ ගොඩනැගිල්ලක ඉදිකිරීම් වෙනුවෙන් රු. 35,000,000 ක මුදලක් ලබා දී	තේ දේශීය වශයෙන් ප්‍රවර්ධනය කිරීම අරමුණු කොට දේශීය ප්‍රචාරණ වැය ශීර්ෂය යටතේ මේ සඳහා රු.1,000,000 ක මුදල් දායකත්වයක් ලබාදෙන ලදී. ජාතික වැවිලි කළමනාකරණ ආයතනය ශ්‍රී ලංකා තේ මණ්ඩලය මගින් සිදු කරනු ලබන	අමාත්‍ය මණ්ඩල තීරණය හා ගැසට් පත්‍රය ප්‍රකාරව අලෙවි ප්‍රවර්ධන අරමුදලට මාරු කරනු ලබන බලපත්‍ර ගාස්තු වටිනාකම තේ අලෙවි ප්‍රවර්ධන කටයුතු වලින් බැහැර කාර්යයන් සඳහා

තිබුණි.	සංවර්ධන, නියාමන සහ අපනයන අංශයන් හා සම්බන්ධ ව්‍යාපෘති හා ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් දායකත්වය ලබා දෙයි. ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ අලෙවි ප්‍රවර්ධන අරමුදලට අයකර මාරු කරනු ලබන බලපත්‍ර ගාස්තුවෙන් 50%ක් තේ වගා හා තේ කර්මාන්තයේ සංවර්ධනය සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා දී ඇත.	උපයෝජනය නොකළ යුතුය.

2. මූල්‍ය සමාලෝචනය

2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.147,414,751 ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.194,872,796 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 47,458,045 ක පිරිහීමක් නිරීක්ෂණය විය. ඉකුත් වර්ෂයට සාපේක්ෂව සංවර්ධන හා පරිපාලන වියදම් පිළිවෙලින් රු. 1,123,281,624 කින් හා රු. 65,768,374 කින් ඉහළ යාම මෙම පිරිහීමට ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

2.2 ප්‍රධාන ආදායම් හා වියදම් විෂයයන්වල ප්‍රවණතා විශ්ලේෂණය

සංවර්ධන වියදම් වෙනුවෙන් ප්‍රවර්ධන හා අළෙවිකරණ බදු අරමුදලින් සහ බලපත්‍ර ගාස්තු මඟින් ලද ආදායම රු.1,503,030,247 ක් වී තිබූ අතර ඉකුත් වර්ෂය හා සැසඳීමේදී ස්ථාවර තැන්පතු පොලී අදායම සියයට 19 කින් අඩු වී තිබූ අතර රසායනාගාර ආදායම් සියයට 66 කින් ද , තේ ප්‍රවර්ධන හා අලෙවිකරණ බදු අරමුදලේ පොලී ආදායමෙන් තේ මණ්ඩලය වෙත මාරු කරන ලද මුදල් ප්‍රමාණය සියයට 79 කින් ද ද, වාණිජ ක්‍රියාකාරකම් මගින් ඉපැයූ ලාභය සියයට 12 කින් ද වැඩිවී තිබුණි. සංවර්ධන , මූල්‍ය සහ පරිපාලන යන වියදම් පිළිවෙලින් සියයට 335 කින් , සියයට 23 කින් සහ සියයට 12 කින් වැඩි වී තිබුණි.

2.3 අනුපාත විශ්ලේෂණය

සමාලෝචිත වර්ෂයේ ජංගම හා ක්ෂණික වත්කම් අනුපාතයන් 3 : 1 ක් වූ අතර පසුගිය වර්ෂයෙදි එම අනුපාත 3: 1 ක් වී තිබුණි. පෙර වර්ෂයට සාපේක්ෂව ජංගම වත්කම් සියයට 7 කින් අඩු වී තිබුණු නමුත් ජංගම වගකීම්ද ඊට අනුලෝමව සියයට 7 කින් අඩු වී තිබීම හේතුවෙන් මෙම අනුපාත පසුගිය වර්ෂය හා සැසඳීමේදි නොවෙනස්ව තිබුණි.

3. මෙහෙයුම් සමාලෝචනය

3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

	විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	සිලොන් තේ සිංහ ලාංඡන වෙළෙඳ සන්නාමය ප්‍රචාරණය කිරීම සඳහා රු. 597,688,264 ක සහනාධාරයක් තේ අපනයනකරුවන්ට තේ ප්‍රවර්ධන බදු අරමුදල මගින් ලබා දී තිබුණු අතර ව්‍යාපෘතියෙහි ප්‍රමාණාත්මක ඉලක්ක වෙත ළඟා වී ඇත්ද යන්න තහවුරු කර ගැනීමට සිංහ ලාංඡනය සහිත අගය එකතුකළ තේ අපනයන ප්‍රමාණය කොපමණදැයි හඳුනාගැනීම සඳහා නිශ්චිත ක්‍රමවේදයක් මණ්ඩලය විසින් මේ දක්වා හඳුනාගෙන නොතිබුණි.	සිංහ ලාංඡනය සහිත තේ අපනයනය කිරීමේදී තත්ත්වයන්ට ග්‍රහණය කර ගැනීමට තිබූ බාධා මේ වන විට විසඳා ඇති අතර ඉදිරියේදී එම ලාංඡනය සහිත අගය එකතු කළ තේ අපනයන ප්‍රමාණය කොපමණදැයි හඳුනාගැනීම සඳහා ශ්‍රී ලංකා රේගුව හා සාකච්ඡා කර එයට අවශ්‍ය තොරතුරු CUSDEC පත්‍රිකාවට ඇතුළත් කර CUSDEC පත්‍රිකාව හරහා ඉදිරියේදී මෙම සිංහ ලාංඡනය සහතික කරන ලද තේ සමස්ත තොරතුර ලබා ගැනීමේ ක්‍රමවේදයක් සකස් කර ඇති අතර එය ක්‍රියාත්මක කිරීමේ අදියරේ පවතී.	ව්‍යාපෘතියෙහි අපේක්ෂිත ඉලක්ක ළඟාවී ඇත්ද යන්න සහ එහි පිරිවැයට සාපේක්ෂ ප්‍රතිලාභ තහවුරු කරගැනීම සඳහා නිශ්චිත ක්‍රමවේදයක් හඳුන්වාදීමට කඩිනමින් පියවර ගත යුතුය.
(ආ)	2014 වර්ෂයේදී ආරම්භ කරන ලද "ටී මෝමන්ට්ස් " නම් වූ කොළඹ තේ අලෙවි මධ්‍යස්ථානයෙන් මණ්ඩලයට රු.62,603,006 ක අලාභයක් සිදු වී තිබූ අතර වැවිලි කර්මාන්ත අමාත්‍යාංශ ලේකම්ගේ 2016 දෙසැම්බර් 06 දිනැති ලිපිය මගින් අපරික්ෂාකාරී ලෙස කටයුතුකළ නිලධාරීන්ට විරුද්ධව සුදුසු ක්‍රියාමාර්ග ගැනීමට කටයුතු කළ යුතු බව සභාපති වෙත දන්වා තිබුණද, මේ වන විටත් කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.	ශ්‍රී ලංකා තේ මණ්ඩලය විසින් මූලික විමර්ශන නිලධාරී පත් කර ඇති අතර විමර්ෂන වාර්තාව ශ්‍රී ලංකා තේ මණ්ඩලය වෙත මේ වනතුරු ලැබී නොමැත.	මෙම අලාභය සඳහා වගකිව යුතු පාර්ශවයන් හඳුනාගෙන අලාභ අයකරගැනීමට කඩිනම් පියවර ගත යුතුය.
(ඇ)	2012 ජුනි 19 දින පැවති ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ නියෝග අංක 11 ප්‍රකාරව මණ්ඩලය විසින් 2003 වර්ෂයේදී ජනතා වතු සංවර්ධන මණ්ඩලයට ලබාදුන් රු.25,000,000 ක ණය මුදලක් වෙනුවෙන් ජනතා වතු සංවර්ධන මණ්ඩලයට අයත් හන්තාන පිහිටි "Ceylon Tea Museum" හි අයිතිය තේ මණ්ඩලයට පැවරීමට තීරණය වී තිබුණු නමුත්, වර්ෂ 10 කට වැඩි කාලයක් ගත වුවද මේ	පවරා ගැනීමේ කටයුතු සම්බන්ධයෙන් ආමාත්‍යාංශ ලේකම්තුමාගේ ප්‍රධානත්වයෙන් පැවැති රැස්වීම මගින් දේපලෙහි නීත්‍යානුකූලබව සම්බන්ධ යෙන්සොයා බලා පවරා දීමට කටයුතු කිරීමට තීරණය විය.	මණ්ඩලය විසින් බාහිර පාර්ශවයක් වෙත දී ඇති මෙම ණය මුදල අයකර ගැනීමට හෝ විධිමත් පරිදි නිරවුල් කර ගැනීමට කටයුතු කළ යුතුය. එමෙන්ම පොදු ව්‍යාපාර කාරක සභාවේ නියෝග ක්‍රියාත්මක කිරීමට කටයුතු කළ යුතුය.

	දක්වා වත්කම් හි අයිතිය පවරා ගැනීමට හෝ, ණය මුදල් ආපසු අයකර ගැනීමට කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. එසේම 2020 වර්ෂයේදී අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතියෙන් තේ මණ්ඩලය විසින් ජනතා වතු සංවර්ධන මණ්ඩලයට රු.10,000,000 ක ණය මුදලක් ලබාදී තිබුණු අතර සමාලෝචිත වර්ෂය අවසානයට ඉන් රු.1,000,000 ක් පමණක් අයකරගෙන තිබුණි.		
(ඉ)	කළුතර ප්‍රාදේශීය කාර්යාලය පවත්වා ගෙන යනු ලබන රූඩ් 1. පර්චස් 20 ක වර්ග ප්‍රමාණයක් වූ ඉඩම 2014 වර්ෂයේ සිට අවුරුදු 30 ක කාලයක් සඳහා ශ්‍රී ලංකා තේ මණ්ඩලය වෙත දීර්ඝකාලීන බදු පදනම මත ලබා දීමට ඉඩම් කොමසාරිස් ජනරාල් විසින් බස්නාහිර පළාත්, පළාත් ඉඩම් කොමසාරිස් වෙත ඉදිරිපත් කරන ලද අංක 4/10/37833 දරන ලිපියෙන් තහවුරු වුවද, මෙතෙක් බදු ගිවිසුමක් අත්සන් කර නොතිබුණි .	ශ්‍රී ලංකා තේ මණ්ඩලය ඉල්ලීම් කලද බදු ගිවිසුම සකස් කිරීම සිදු කරනුයේ පාලින්ද නුවර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් වන බැවින් මෙතෙක් එම බදු ගිවිසුම සකසා ඉදරිපත් කර නොතිබීම හේතුවෙන් මෙම ගිවිසුම්ගත වීම ප්‍රමාද වී ඇත.	නීත්‍යානුකූල බදු ගිවිසුමකට එළඹීම තුලින් වත්කම් පාලනය විධිමත් කළ යුතුය.
(ඊ)	නුවරඑළිය ප්‍රාදේශීය කාර්යාලය පවත්වාගෙන යනු ලබන ඉඩමේ අයිතිය කැලණි වැලි සමාගමෙන් හා නුවරඑළිය ප්‍රාදේශීය ලේකම් මඟින් නීත්‍යානුකූලව මණ්ඩලය වෙත පවරා ගෙන නොතිබුණි.	නුවරඑළිය ප්‍රාදේශීය කාර්‍යාලය ඉදි කර ඇති ඉඩම ශ්‍රී ලංකා තේ මණ්ඩලයට පවරා ගැනීමට අදාලව කටයුතු සිදු වෙමින් පවතින අතර මෙම ඉඩම පවරා ගැනීම සම්බන්ධව ක්‍රියා කිරීමේදී අනෙකුත් රාජ්‍ය ආයතන සමඟ සම්බන්ධව සිදු කිරීම හේතුවෙන් ප්‍රමාද වී ඇත.	නීත්‍යානුකූල හිමිකමක් නොමැති ඉඩමක ගොඩනැගිලි ඉදිකිරීම සිදුකර ඇති බැවින් ඉඩමේ නීත්‍යානුකූල අයිතිය මණ්ඩලයට ලබාගැනීමට නොපමාව කටයුතු කළ යුතුය.

3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

	විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	“සිලෝන් ටී” සඳහා ගෝලීය ප්‍රවර්ධන සහ අලෙවි වැඩසටහන යටතේ සාම්ප්‍රදායික ඉහල මට්ටමේ ප්‍රචාරණය සඳහා රූපවාහිනි මාධ්‍යය යොදාගැනීමට ඉංග්‍රීසි භාෂාවෙන් රූපවාහිනි වෙළෙඳ දැන්වීම	සිලෝන් ටී සඳහා ගෝලීය ප්‍රවර්ධන හා අලෙවි වැඩසටහන් යටතේ මූලිකවම රූපවාහිනී මාධ්‍යයේ ප්‍රචාරණය කිරීම අරමුණු කරගෙන මෙම වෙළෙඳ දැන්වීම නිර්මාණය කරන ලදී. කෙසේ නමුදු මේ සඳහා මාධ්‍යය මිලදී ගැනීම්	මෙම නිර්මාණාත්මක කාර්යයන් හි වර්තමාන සහ ඉදිරි භාවිතයට ඇති හැකියාව පිළිබඳ නිසි ඇගයීමක් සිදුකර ඒ මත පදනම්ව ගෝලීය ප්‍රවර්ධන

	නිර්මාණයට හා එය චීන, ජපන්, අරාබි, යුක්රේන්, ජර්මන් සහ තුර්කි භාෂා මාධ්‍යයන් වලට සිදුකරන ලද පරිවර්තන සඳහාද 2016 සිට 2020 වර්ෂය දක්වා රු.174,332,138 ක වියදමක් දරා තිබුණද එම වෙළෙඳ දැන්වීම නිර්මාණය කිරීමේ මූලික අරමුණ වූ රූපවාහිනි මාධ්‍ය තුළ ප්‍රචාරණය සිදුකර ගැනීමට අවශ්‍ය මාධ්‍ය මිලදී ගැනීම හා ඒ සම්බන්ධ සැලසුම් සකස් කර නොතිබුණු බැවින් රූපවාහිනි මාධ්‍ය තුළ ප්‍රචාරණයක් සිදුකර නොතිබුණි. එසේම රු. 39,832,808 ක වියදමින් නිර්මාණය කරන ලද නිර්මාණාත්මක කාර්යයන් 31 ක්ද සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් අදාළ කාර්යයන් වෙනුවෙන් උපයෝජනය කර නොමැති බව නිරීක්ෂණය විය.	සිදු නො වුවද මෙම වෙළෙඳ දැන්වීම නොයෙකුත් ප්‍රචාරණ කටයුතු සඳහා භාවිතා කරන ලදී.	සහ අලෙවිකරණ වැඩසටහන් සඳහා උපයෝජනය කළ යුතුය.
(ආ)	ශ්‍රී ලංකා තේ මණ්ඩලය විසින් ක්‍රියාත්මක කරනු ලබන "සිලෝන් ටී" සඳහා ගෝලීය ප්‍රවර්ධන සහ අලෙවි වැඩසටහනේ නිර්මාණාත්මක කටයුතු යටතේ www.pureceylontea.com ප්‍රධාන වෙබ් අඩවිය සහ අනෙකුත් භාෂා පරිවර්තිත වෙබ් අඩවි දත්ත පරිදි සමාලෝචිත වර්ෂයේ විදේශීය පරිශීලක ප්‍රවේශවීම් 29,228 ක් පමණ නිරීක්ෂණය වූ අතර රු.172,939,768 ක පිරිවැයක් යටතේ නිර්මාණය කරන ලද වෙබ් අඩවිය වෙත අන්තර්ජාතික වශයෙන් ප්‍රමාණවත් පාරිභෝගික/පරිශීලක ආකර්ෂණය ලැබී නොමැති බව නිරීක්ෂණය විය.	ගෝලීය ප්‍රවර්ධන වැඩසටහන ක්‍රියාත්මක නොවීම හේතු කොට ගෙන මෙම වෙබ් අඩවිය සඳහා අපේක්ෂිත ප්‍රවර්ධනයක් නොලැබුණු බව සඳහන් කළ යුතුයි. එසේ වුවද මෙම වෙබ් අඩවිය තේ මණ්ඩලය ක්‍රියාත්මක කරන සියලුම ප්‍රචාරණ කටයුතුවලදී අවශ්‍ය ප්‍රචාරණය ලබාදීමට කටයුතු සිදුකරමින් සිටී.	අන්තර් ජාතික වශයෙන් පාරිභෝගික/පරිශීලක ආකර්ෂණය වෙබ් අඩවිය වෙත ලගා කර ගැනීම තුළින් ගෝලීය ප්‍රවර්ධන වැඩසටහන යටතේ අපේක්ෂිත අරමුණු ලඟාකර ගැනීම සඳහා වෙබ් අඩවිය ඵලදායී ලෙස උපයෝජනය කිරීමට සඳහා කටයුතු කළ යුතුය.
(ඇ)	ශ්‍රී ලංකා තේ ගෝලීය වශයෙන් ප්‍රවර්ධනය කිරීම සඳහා මාධ්‍ය සමීක්ෂණ හා මාධ්‍ය සැලසුම් සකස් කිරීම වෙනුවෙන් 2019 සිට 2023 කාලපරිච්ඡේදය තුළ රු.107,088,740 ක මුදලක් වියදම් කර තිබූ නමුත් එම කායීයන් සමාලෝචිත වර්ෂය අවසානය දක්වා ක්‍රියාත්මක කර නොතිබුණි.	මාධ්‍ය සැලසුම් ක්‍රියාත්මක කිරීම අදාළ කාල පරාසය තුළ සිදු නොවූ බව පිළිගනිමි.	මාධ්‍ය සැලසුම්වල වර්තමාන සහ ඉදිරි භාවිතයට ඇති හැකියාව පිළිබඳ නිසි ඇගයීමක් සිදුකර එම සැලසුම් ගෝලීය ප්‍රවර්ධන සහ අලෙවිකරණ වැඩසටහන් සඳහා උපයෝජනය කරගත යුතුය.

	තවද සකස් කර තිබූ මාධ්‍ය සැළසුම් සමාලෝචිත වර්ෂය අවසාන වන විට එහි සඳහන් කාලය ඉකුත් වී තිබුණි.		
(ඇ)	ඉන්දු ශ්‍රී ලංකා නිදහස් වෙළඳ ගිවිසුම (ISFTA) සහ පාකිස්තාන - ශ්‍රී ලංකා නිදහස් වෙළඳ ගිවිසුම (PSFTA) යටතේ තේ සඳහා මනාප ගාස්තු අනුපාතයක් (Preferential Tariff Rate Quota) පැවතියද, එහි සැලකිය යුතු උපයෝජනයක් 2021 සිට 2024 දක්වා වාර්තාකර නොතිබුණු අතර පකිස්ථානය වෙත වෙළෙඳ ගිවිසුම යටතේ තේ අපනයන සිදුකර නොතිබුණු බවද විගණනයේදී නිරීක්ෂණය විය.	ඉන්දු ශ්‍රී ලංකා නිදහස් වෙළඳ ගිවිසුම සහ පකිස්ථාන ශ්‍රී ලංකා නිදහස් වෙළඳ ගිවිසුම යන ගිවිසුම් යටතේ අපේක්ෂිත අපනයන ප්‍රමාණයන් ළඟා කර ගැනීමට නොහැකි වන්නේ අනෙකුත් තරගකාරී තේ අපනයනය කරන රටවල් වලින් ඔවුන්ට අවශ්‍ය කරන තේ ඉතා අඩුමුදලට ලබාගත හැකි නිසාය. මෙම වෙළෙඳ ගිවිසුම යටතේ Quota වට අවශ්‍ය කරන තේ ප්‍රමාණය සැපයීමට නොහැකි වන්නේ ශ්‍රී ලංකාවේ තේ මිල අධික නිසාය.	නිදහස් වෙළඳ ගිවිසුම්තුළින් උපරිම ප්‍රතිඵල ළගාකර ගැනීමට ඇති සීමාවන් මගහරවා ගෙන අපනයන ප්‍රවර්ධනයට මණ්ඩලයට සිදුකළ හැකි දායකත්වය ලබාදීමට කටයුතු කළ යුතුය.
(ඉ)	ශ්‍රී ලංකාවේ මුළු තේ නිෂ්පාදනය හා අපනයනය ක්‍රමිකව වර්ධනය නොවීම හේතුවෙන් 2011 වර්ෂයේදී සියයට 7.4 ක් වූ ගෝලීය තේ නිෂ්පාදන කොටස සහ සියයට 17.1 ක් වූ ගෝලීය තේ අපනයන වෙළඳපොළ කොටස පිළිවෙලින් සමාලෝචිත වර්ෂය වන විට සියයට 3.7 ක් හා සියයට 13 ක් දක්වා පහළ ගොස් තිබුණු බව තේ කම්ටු ප්‍රවෘත්ති අතිරේකය (Supplement to Annual Bulletin of Statistics 2024) අනුව නිරීක්ෂණය වූ අතර ශ්‍රී ලංකා තේ මණ්ඩලය විසින් තේ නිෂ්පාදනය සහ ප්‍රවර්ධන කටයුතු සඳහා පිළිවෙලින් රු.10,127,936,991 ක් හා රු. 5,439,616,283 ක පමණ වියදමක් 2011 සිට 2024 කාලපරිච්ඡේදය සඳහා සිදුකර තිබුණද ගෝලීය සන්දර්භය තුළ ශ්‍රී ලංකා තේ වලට හිමි ස්ථානය , වෙළෙඳපොල ක්‍රමිකව අහිමිවී යාමක් සිදුව ඇති බව නිරීක්ෂණය විය.	සමස්ත තේ නිෂ්පාදනය මේ වන විට තේ කිලෝ මිලියන 250-260 සීමාව දක්වා පහත වැටී තිබෙන අතර අපනයන ප්‍රමාණයද ඊට සාපේක්ෂව පහත වැටී ඇත. අනෙකුත් තේ නිෂ්පාදනය කරන රටවල් වන චීනය, ඉන්දියාව, කෙන්යාව සහ අනෙකුත් අප්‍රිකානු රටවල් තම තේ නිෂ්පාදනය සැලකිය යුතු ප්‍රමාණයකින් ඉහළ ගොස් ඇති බැවින් ද ලංකාවේ තේ නිෂ්පාදනය ලෝක තේ නිෂ්පාදනය ප්‍රතිශතයක් ලෙස පහල යැමට මෙම තත්ත්වයද බලපා ඇත.	තේ නිෂ්පාදනය වර්ධනය කරගැනීමට සහ ගෝලීය වෙළෙඳපළ තුළ ශ්‍රී ලංකාවේ තේ සඳහා වන කොටස වර්ධනය කරගැනීමට ගුණත්වයෙන් ඉහළ අන්තර්ජාතික ප්‍රමිතීන් වලට අනුකූල සුදුසු තේ වෙනුවෙන් ආයෝජන පුළුල් කිරීම සඳහා අවශ්‍ය දිරිගැන්වීම්, කර්මාන්තය තුළ සිදුකල යුතු නියාමනය සහ පාලනය මණ්ඩලය විසින් සිදුකළ යුතුය.

3.3 නිෂ්කාර්ය හෝ ඌන උපයෝජිත දේපල, පිරියත හා උපකරණ

විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
ප්‍රධාන ගබඩාවේ ලිපි ද්‍රව්‍ය තොග තුළ ඇතුළත්, දිගුකාලීනව චලනය නොවූ තොගයක් වශයෙන් පවතින රු.1,326,816 ක් වටිනා සෙරන්ඩීප් ටී ෆිල්ම් DVD තැටි 542 ක් සහ 2022 වර්ෂයේදීම මිලදී ගෙන තිබූ ටී පොට් 500 කින් පිරිවැය රු.587,755 ක් වූ ටී පොට් 245 ක් සමාලෝචිත වර්ෂය අවසාන වනවිටත් භාවිතා කර නොතිබුණි. අවශ්‍යතාවය නිවැරදිව හඳුනා නොගැනීම නිසා සෙමින් චලනය වන සහ දිගුකාලීනව චලනය නොවූ තොග මිලදීගැනීම් සඳහා යෙදවූ අරමුදල් නිශ්කාර්යව පවතින බව විගණනයේදී නිරීක්ෂණය විය.	මෙහි සඳහන් DVD දැනට එහි අවශ්‍යතාවය ඇති පාර්ශවයන්ගේ ඉල්ලීම මත ලබා දෙනු ලැබේ. මෙම ඉතිරි DVD තැටි ප්‍රමාණය ඉදිරියේදී බෙදා දීමට කටයුතු සිදු කරනු ලැබේ.	අවශ්‍යතාවය නිවැරදිව හඳුනා ගනිමින් ප්‍රශස්ථ මට්ටමින් තොග මිලදීගැනීමත් එම තොග අදාල අරමුණු සඳහා උපයෝජනය කරගැනීමටත් කටයුතු කළ යුතුය.

3.4 ප්‍රසම්පාදන කළමනාකරණය

විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
මණ්ඩලයේ අධ්‍යක්ෂ මණ්ඩල කාමරයේ සිවිලිම අලුත්වැඩියා කිරීම සඳහා රු.2,902,817 ක මුදලකට පෞද්ගලික සමාගමක් වෙත කොන්ත්‍රාත් ප්‍රදානය කර තිබුණු අතර ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.4.4 ප්‍රකාරව කොන්ත්‍රාත් මුදලින් සියයට 20 ක උපරිමයකට යටත්ව අත්තිකාරම් ගෙවිය යුතු වුවත් ඊට පටහැනිව රු.1,643,327 ක මුදලක් එනම් සියයට 50 ක මුදලක් අත්තිකාරම් වශයෙන් ගෙවා තිබුණි.	අවම මිල ඉදිරිපත් කර තිබූ සැපයුම්කරු තාක්‍ෂණ පිරිවිතරය අනුව සුදුසුකම් ලබා තිබූ අතර ඔහු විසින් 50% අත්තිකාරම් මුදලක් ඉල්ලුම් කර තිබුණි. රාජ්‍ය මුදලට වන අවධානම අවම කර ගනිමින් 50% අත්තිකාරම් සුරක්ෂිතයක් ලබා ගැනීමට කටයුතු කර ඇත.	ප්‍රසම්පාදන මාර්ගෝපදේශයේ නියාමනයන් ප්‍රකාරව කටයුතු කළ යුතුය.

3.5 මානව සම්පත් කළමනාකරණය

විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
වර්ෂ 01ත් 05 ත් අතර කාලයක සිට පුරප්පාඩුව පැවති ඉහළ කළමනාකරණ මට්ටමට අයත් නියෝජ්‍ය අධ්‍යක්ෂ (අලෙවිකරණ), අධ්‍යක්ෂ (ප්‍රවර්ධන), අධ්‍යක්ෂ (මූල්‍ය) සහ අධ්‍යක්ෂ (පාලන) යන තනතුරු 04 ක් සඳහා නිලධාරීන් බඳවා ගැනීමට මණ්ඩලය විසින් කටයුතු කර නොතිබුණි.	අධ්‍යක්‍ෂ මණ්ඩල තීරණය පරිදි නියෝජ්‍ය අධ්‍යක්ෂ (අලෙවිකරණ) තනතුර යටපත් කිරීම සඳහා 2023.10.13 දිනැතිව ලේකම් වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය වෙත කෙටුම්පත් කරන ලද අමාත්‍ය මණ්ඩල පත්‍රිකාව යොමු කර ඇත 2023.10.06 දින පැවති අධ්‍යක්‍ෂ මණ්ඩල රැස්වීමේදී අධ්‍යක්‍ෂ (පාලන හා මානව සම්පත්) තනතුර පිරවීම සඳහා අනුමැතිය ලබා දී ඇත.	මණ්ඩලයේ අරමුණු ඉටුකරගැනීමට හා කාර්යය සාධනය ඉහළනංවා ගැනීමට අත්‍යාවශ්‍ය තනතුරු සඳහා නිළධාරීන් බඳවා ගැනීමට සහ නිසි අනුමැතීන් මත කාර්යමණ්ඩල සංශෝධනයට කටයුතු කළ යුතුය .

අධ්‍යක්ෂ (ප්‍රවර්ධන) තනතුර සඳහා ද්විතියන පදනම මත නිලධාරියකු පත්කර ගැනීමට රේඛීය අමාත්‍යාංශයට ඉල්ලීම් කර ඇත.

4 ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

4.1 කළමනාකරණ තොරතුරු පද්ධතියේ ඵලදායීතාවය

විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම	නිර්දේශය
තේ කර්මාන්තය සඳහා තොරතුරු තාක්ෂණ පද්ධතියක් සකස් කිරීම සඳහා රු.53,964,995 ක කොන්ත්‍රාත් වටිනාකමක් මත මණ්ඩලයේ සහකාර අධ්‍යක්ෂකගේ (තොරතුරු තාක්ෂණ) තහවුරුවකින් එකතුව රු.15,716,148 ක් සමාලෝචිත වර්ෂය අවසන් වනවිට පුද්ගලික ආයතනයකට ගෙවීම් කර තිබුණි. වසර 04 කට ආසන්න කාලයක් ගත වුවද පද්ධතිය සකස් කර නොතිබුණු අතර යථෝක්ත මූලික ගිවිසුමෙන් පරිබාහිරව රු.2,822,400 ක කොන්ත්‍රාත් ප්‍රදානයක් 2022 සැප්තැම්බර් 01 දින ඉහත පුද්ගලික ආයතනය වෙතම සිදුකර තිබුණි. කොන්ත්‍රාත් ප්‍රදාන 02 කම නිමකර නොතිබුණු අතර පුද්ගලික ආයතනය විසින් ලබා දුන් කාර්යසාධන සුරක්ෂණවල වලංගු කාලය අවසන් වී තිබුණද විගණිත දින වන විටත් ගිවිසුම් ප්‍රකාරව එය දීර්ඝ කිරීමට කටයුතු කර නොතිබුණි.	තොරතුරු තාක්ෂණ පද්ධතියෙහි වත්මන් ප්‍රගතිය අධ්‍යක්ෂ මණ්ඩලය වෙත වාර්තා කර ඇති අතර දැනට ආයතනයක් ලෙස මුහුණ දෙන ප්‍රධාන බාධක පිළිබඳව දැනුවත් කර ඇත. කාර්යසාධන සුරක්ෂණ වල වලංගු කාලය දීර්ඝ කිරීම සඳහා පුද්ගලික ආයතනය වෙත අවශ්‍ය කටයුතු කරන ලෙස දන්වා ඇත.	කාර්යසාධන සුරක්ෂණය දීර්ඝ කර ගැනීමේ කටයුතු සහ තොරතුරු තාක්ෂණ පද්ධතිය ස්ථාපිත කිරීමේ ක්‍රියාවලිය කඩිනමින් අවසන් කිරීමට කටයුතු කළ යුතුය.